**නොච්චියාගම ප්‍රාදේශීය සභාව - 2023**
**----------------------------------------**

## 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 ව්‍යාවනය කළ මතය

නොච්චියාගම ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය කිරීමේ පදනම කොටසේ දක්වා ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මාහට නොහැකි විය.

### 1.2 ව්‍යාවනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ව්‍යාවනය කළ මතයක් පළකරනු ලැබේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, ව්‍යාවනය කළ මතය සඳහා පදනම ඡේදයේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සපයා ගැනීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ ඔක්තෝබර්, නොවැම්බර් සහ දෙසැම්බර් මාස සඳහා ලැබිය යුතු උසාවි දඩ රු.2,345,014 ක් වුවත් එය රු.1,466,473 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | 2023 ජනවාරි 01 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.2,966,100 ක් වුවත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ එය රු.3,123,849 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.1,476,600 ක් වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | නිකවැරටිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ බවට තහවුරු කරන ලද රු.254,000 ක මුද්දර ගාස්තු ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පාරවල්, පාලම් හා බෝක්කු ක්ෂය රු.2,385,585 ක් විය යුතු වුවත් එය ක්ෂය ගිණුමේ හා ක්ෂය වෙන්කිරීම් ගිණුමේ පිළිවෙලින් රු.4,348,966 ක් සහ රු.1,965,381 ක් ලෙස දක්වා තිබුණි. | පිළිගන්නා බව. | නිවැරදි වටිනාකම ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | 2023 දෙසැම්බර් 31 දිනට තැන්පතු වර්ග 04 ක ශේෂය රු.4,016,574 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.5,046,123 ක් ලෙස වැඩියෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු කඩ කාමර තැන්පතු රු.135,000 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ එය රු.105,000 ක් ලෙස අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාතර්ා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් හා මුදල් සමාන දෑ යටතේ 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ගිණුම් 05 කට අදාළ ශේෂය රු.13,997,242 ක් වුවත් වත්කම් සහ වගකීම් ප්‍රකාශනයේ සටහන 11 අනුව එය රු.15,699,701 ක් වුයෙන් රු.1,702,459 ක වෙනසක් විය. | පිළිගන්නා බව. | උපලේඛන අනුරූපී වාර්තා සමඟ සැසඳිය යුතුය. |
| (ආ) | වත්කම් අයිතම 03 කට අදාළව වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ දක්වා තිබූ වටිනාකම සහ ඊට අදාළ උපලේඛනවල සඳහන් වටිනාකම රු.138,762 කින් වෙනස් වී තිබුණි. | -එම- | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අයිතම 02 ක ශේෂය හා ඊට අදාළව උපලේඛන අනුව ශේෂය අතර රු.233,064 ක වෙනසක් විය. | -එම- | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ යන්ත්‍ර 04 ක් කුලියට ලබාදීමට අදාළ ආදායම විස්තීරණ ආදායම් ප්‍රකාශනය අනුව රු.1,509,695 ක් වුවත් කුලියට ලබාදීම් ලේඛනය අනුව එය රු.1,158,475 ක් වුයෙන් රු.351,220 ක වෙනසක් විය. | -එම- | -එම- |

### 1.6.3 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

| | විෂය | මුදල | නොසැපයු විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | ------ | -------<br>රු. | --------------------- | ----------- | --------- |
| (i) | ලැබිය යුතු වෙළඳ බලපත්‍ර ගාස්තු | 147,740 | (i) විස්තරාත්මක උප ලේඛන<br>(ii) කාල විශ්ලේෂණ | අදහස් දක්වා නොමැති බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (ii) | ලැබිය යුතු කසළ බදු | 24,000 | (i) විස්තරාත්මක උප ලේඛන<br>(ii) කාල විශ්ලේෂණ | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (iii) | හිඟ ටෙන්ඩර් බදු ආදායම | 9,539,674 | (i) විස්තරාත්මක උප ලේඛන<br>(ii) කාල විශ්ලේෂණ | -එම- | -එම- |
| (iv) | පුස්තකාල පොත් | 3,100,764 | (i) විස්තරාත්මක උප ලේඛන<br>(ii) සමීක්ෂණ වාර්තා | -එම- | -එම- |
| (v) | 2020 ජනවාරි 01 දිනට පසු ඉදිකළ ගොඩනැගිලි | 20,029,485 | (i) ගොඩනැගිලි උප ලේඛනය<br>(ii) ඉදිකළ ව්‍යාපෘතිය<br>(iii) මිලදීගත් වර්ෂය | -එම- | -එම- |
| (vi) | ඉඩම් | 243,237,730 | (i) ඉඩම් උප ලේඛනය | -එම- | -එම- |
| (vii) | මාර්ග, බෝක්කු සහ පාලම් | 23,156,236 | (i) මාර්ග, බෝක්කු හා පාලම් උපලේඛන<br>(ii) ඉදිකළ ව්‍යාපෘතිය හා වර්ෂය | -එම- | -එම- |
| (viii) | 2020 ජනවාරි 01 දිනට පසු මිලදීගත් ලී බඩු | 2,999,353 | (i) ලී බඩු උපලේඛනය<br>(ii) මිලදීගත් ව්‍යාපෘතිය<br>(iii) මිලදීගත් වර්ෂය | -එම- | -එම- |
| (ix) | 2020 ජනවාරි 01 දිනට පසු මිලදීගත් පරිගණක | 4,930,953 | (i) පරිගණක උපලේඛනය<br>(ii) මිලදීගත් ව්‍යාපෘතිය<br>(iii) මිලදීගත් වර්ෂය | අදහස් දක්වා නොමැති බව. | තහවුරු කිරීම් ඉදිරිපත් කළ යුතුය. |
| (x) | කාර්යාල උපකරණ | 1,739,541 | (i) කාර්යාල උපකරණ උපලේඛනය<br>(ii) මිලදීගත් ව්‍යාපෘතිය<br>(iii) මිලදීගත් වර්ෂය | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (xi) | සවිකිරීම් | 8,864,204 | (i) සවිකිරීම් උපලේඛනය<br>(ii) සවිකිරීම් කළ ව්‍යාපෘතිය<br>(iii) සවිකළ වර්ෂය | -එම- | -එම- |
| (xii) | පිරියත හා උපකරණ | 33,922,281 | (i) පිරියත හා සවිකිරීම් උපලේඛනය<br>(ii) සවිකිරීම් කළ ව්‍යාපෘතිය<br>(iii) මිලදීගත් වර්ෂය | -එම- | -එම- |
| (xiii) | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ සඳහන් ගැලපීම | 600,208 | (i) ශේෂ සනාථ කිරීම් | -එම- | -එම- |
| (xiv) | ජල බිල්පත් ආදායම් | 12,017,734 | (i) උපලේඛන | -එම- | -එම- |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1) (ඇ) වගන්තිය | මූල්‍ය සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, පොත්පත් හා ගිණුම් පවත්වාගෙන යාම, මූල්‍ය කළමනාකරණය සහ කළමනාකරණ තොරතුරු සැපයීමේ ක්‍රමවේදය සඵලදායී ලෙස සිදුවන බවට සභාවේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා ලෙස කටයුතු කරනා බලතල සහ කාර්ය ඉටුකරන නිලධාරි වන සභාවේ ලේකම් විසින් නිසි පරිදි ඉටුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | පනතේ විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව | | | |
| (i) 20 අතුරු ව්‍යවස්ථාව | ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් ලබානොගෙන පෞද්ගලික ආයතන 02 ක නොච්චියාගම නගරයේ කුකුල් මස් වෙළදාම සිදුකරමින් පැවතුණු අතර එම ස්ථාන සම්බන්ධව නියාමන කටයුතු කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | -එම- | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |
| (ii) 32 අතුරු ව්‍යවස්ථාවේ 9 උපවගන්තිය | මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් පරීක්ෂා කරනු ලබන සෑම මාංශ කිලෝ එකකටම රු.10 නොඉක්මවන ගාස්තුවක් අයකළ යුතු වුවත් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඝාතනය වන සතුන් පිළිබඳ වාර්තා ලබාගැනීම හෝ එම ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්ම වූ ආදායම රු.3,624,575 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.7,357,404 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,755,463 | 3,904,611 | 5,549,350 | 3,750,810 | 3,244,500 | 3,484,481 | 2,741,860 | 5,395,549 |
| (ii) | කුලී | 10,900,200 | 13.526,580 | 12,018,953 | 17,519,451 | 10,244,137 | 7,893,050 | 7,043,467 | 16,011,824 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,708,240 | 1,150,370 | 1,150,370 | 147,740 | 1,750,000 | 1,568,066 | 1,568,066 | 147,740 |
| (iv) | වෙනත් ආදායම් | 24,823,443 | 28,816,158 | 13,266,556 | 28,045,447 | 24,239,020 | 21,258,363 | 23,399,215 | 12,495,845 |
| | | 41,187,346 | 33,871,139 | 31,985,229 | 49,463,448 | 39,477,657 | 34,203,960 | 34,752,608 | 34,050,958 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් හා බදු රු.3,750,810 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ බිල්කිරීම රු.3,904,611 ක් වූ බැවින් බිල්කිරීමෙන් සියයට 96 ක් අයකරගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වරිපනම් අයකිරීම 2005 වර්ෂයේදී සිදුකරන ලද දේපළ තක්සේරුව අනුව සිදුවන අතර 2005-2023 කාලය තුළ සිදුවී තිබෙන ඉදිකිරීම් අයිතිය මාරුවීම් අනුව හා වෙනස් කිරීම් අනුව ගාස්තු අයකිරීම් සංශෝධන වී නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | දේපළ තක්සේරු කරවා ගෙන ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iii) | රාජ්‍ය ආයතනයකින් අයවිය යුතු රු.932,443 ක වරිපනම් හිඟය අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | -එම- | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |
| (iv) | වරිපනම් හිඟය තුළ වසර 3 ත් 20 ත් අතර කාලයක සිට පැවතෙන හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(අ) ඡේදයේ සඳහන් බලතල ප්‍රකාරව දේපළ පවරා ගැනීම් වැනි නීතිමය පියවරගෙන නොතිබුණි. | -එම- | අය නොවන වරිපනම් හිඟ අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගත යුතුය. |
| (ආ) | **කුලී** | | |
| | වත්කම් බදුදීම වෙනුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු රු.1,514,865 ක හිඟ කුලී අයකරගෙන නොතිබුණි. | -එම- | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | **බලපත්‍ර ගාස්තු** | | |
| (i) | බල ප්‍රදේශයේ තිබෙන සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 02 කින් අයවිය යුතු සියයට 01 ක බලපත්‍ර ගාස්තු රු.91,626 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිටත් අයකර නොතිබුණි. | -එම- | අයකර ගැනීම කඩිනම් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | බල ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත, ව්‍යාපාර වෙළෙඳ බලපත්‍ර ලබාගත යුතු ආයතන සහ දැන්වීම් පුවරු පිළිබඳව වීදි අනුව, මාර්ග අනුව විධිමත් සමීක්ෂණයක් සිදුකර විස්තර ලේඛනගත කර නිවැරදි ගාස්තු ප්‍රමාණයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | අදාළ සමීක්ෂණ සිදුකර ගාස්තු අයකර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (ඇ) | **වෙනත් ආදායම්** | | |
| (i) | සභාවට අයත් නොච්චියාගම, කුකුල්කටුව, හොරුවිල, ඉහළවැටියාව ජල ව්‍යාපෘතිවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු හිඟ ජල ගාස්තු රු.6,823,873 ක් අයකරගෙන නොතිබුණි. | -එම- | අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | ජල ව්‍යාපෘතිවලින් ලැබෙන ආදායම්, වියදම් සඳහා ප්‍රමාණවත් නොවන අතර ජල ගාස්තු සංශෝධනය කර අවම වශයෙන් පවත්වාගෙන යාමේ පිරිවැය හා නඩත්තු වියදම් ආවරණය වන පරිදි ගාස්තු අයකිරීම සඳහා කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | ජල ව්‍යාපෘතිවල නඩත්තු වියදම් සඳහා ප්‍රමාණවත් පරිදි ගාස්තු සංශෝධන කිරීමට ක්‍රියාකළ යුතුය. |
| (iii) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.16,401,637 ක් හා මුද්දර ගාස්තු රු.3,230,600 ක් වූ අතර 2022 සහ 2023 සඳහා මුද්දර ගාස්තු බිල්කිරීම් සිදුකර නොතිබුණි. | -එම- | ලැබිය යුතු ආදායම් බිල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය හැකිව තිබූ නමුත් 2023 දෙසැම්බර් 31 දින වනවිටත් එම කාරණා වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | ප්‍රාදේශීය සභා පනත අනුව අතුරු ව්‍යවස්ථා පනවාගත යුතුය. |

**3.2 හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පුස්තකාලයෙන් බැහැරට දුන් පොත් 217 ක් ලැබී නොතිබීම නිසා එයට වගකිවයුතු තැනැත්තන්ගෙන් එම පොත් නැවත ප්‍රතිස්ථාපනය කිරීමට වැය වන මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව | අලාභය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව විසින් වාර්ෂික බදු පදනම මත මස් අලෙවි කිරීම සඳහා ලබාදුන් නොච්චියාගම නගරයේ තිබෙන මස් අලෙවි සැල් භෞතිකව පරීක්ෂා කිරීම සඳහා සභාවේ ලේකම් විසින් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත බලය පැවරීමත් සිදුකළ යුතු වුවත් එවැනි බලය පැවරීමක් 2023 වර්ෂයේදී සිදුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | පොදු සම්මත අතුරු ව්‍යවස්ථාව ප්‍රකාරව ක්‍රියාකළ යුතුය. |

**3.4 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළාඹය පෙර පාසල සඳහා වසර 02 කට පෙර ඉදිකළ නව ගොඩනැගිල්ල නිෂ්කාර්යව පැවති අතර කළාඹය පන්සල් භූමිය මධ්‍යයේ වූ අනාරක්ෂිත ස්ථාන 02 ක පෙර පාසල් පවත්වාගෙන යමින් පැවතුණි. | අදහස් දක්වා නොමැති බව. | නව ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීම සඳහා කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සභාව විසින් ඉදිකරන ලද වටිනාකම රු.11,695,013 ක් වූ ගොඩනැගිලි 03 ක් හා වටිනාකම අනාවරණය නොවූ නිල නිවාසය භාවිතයට ගැනීම හා ආදායම් උත්පාදන අරමුණ සඳහා යෙදවීම සඳහා අවශ්‍ය කටයුතු නොකිරීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | -එම- | ප්‍රයෝජනයට ගැනීමට අවධානය යොමුකළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1. වාෂරීක ක්‍රියාකාරි සැලස්ම**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය වෙනුවෙන් සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලස්ම අනුව ප්‍රජා සංවර්ධන සහ සෞඛ්‍ය සනීපාරක්ෂක ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබුණු රු.2,100,000 ක ප්‍රතිපාදන වෙන් කරන ලද වැඩසටහන් 05 ක් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | සැලසුම් කළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**4.2 පාරිසරික ගැටලු**

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|
| සභාවේ කසළ මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.16,938,732 ක් වැය කර තිබුණු නමුත් අවිධිමත් ලෙස කසළ බැහැර කිරීම නිසා පරිසරයට ද හානි සිදුවෙමින් පැවතුණු අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය ප්‍රමාණවත් අවධානයක් ද යොමුකර නොතිබුණි. | අදහස් දක්වා නොමැති බව. | කසළ කළමනාකරණ මධ්‍යස්ථානය සක්‍රියව පවත්වාගෙන යාමට ක්‍රියාකළ යුතුය. |